{සියලු ම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලු ම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

පළාත් අධ්‍යාපන දෙපාතර්මේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித்திணைக்களம்- வடமத்திய மாகாணம்
Department of Education – North Central Province

ශ්‍රේණිය - 13	තෙවන වාර පරීක්ෂණය - 2025	කාලය : පැය දෙකයි

විෂයය : දේශපාලන විද්‍යාව 23 S	පත්‍රය I	ඇතුළත්වීමේ අංකය .....

උපදෙස් : -

- මෙම ප්‍රශ්න පත්‍රය **A සහ B යනුවෙන් කොටස් දෙකකින් සමන්විතය.**
- **A කොටස බහුවරණ ප්‍රශ්න 30කින් සහ B කොටස කෙටි ප්‍රශ්න 20 කින් යුක්ත වේ.**
- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සැපයිය යුතුය.**
- **එක් පිළිතුරකට ලකුණු දෙක බැගින් ලකුණු 100කි.**

A - කොටස

- **අංක 1 සිට 20 තෙක් ඇති ප්‍රශ්නවලට නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.**

1. දේශපාලනය සමාජ භාවිතයක් වන්නේ,

(1) වෘත්තීය දේශපාලනඥයන්ට සීමා වී පවතින බැවිනි.
(2) ශාස්ත්‍රීය ලෙස දේශපාලනය අධ්‍යයනය කරන බැවිනි.
(3) පුරවැසි සහභාගිත්වයෙන් සිදුවන බැවිනි.
(4) ආණ්ඩුකරණය සම්බන්ධ ක්‍රියාවලි අධ්‍යයනය කරන බැවිනි.
(5) ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලි අධ්‍යයනය හේතුවෙනි. (.....)

2. දේශපාලනය ශාස්ත්‍රීය ලෙස අධ්‍යයනය කිරීමේ ප්‍රවේශයන් සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) බහු විෂයික ප්‍රවේශය සාම්ප්‍රදායික අධ්‍යයන ප්‍රවේශයක් වේ.
(2) විද්‍යාත්මක ප්‍රවේශය සදාචාරාත්මක අගය කිරීම් සහිත වේ.
(3) නූතන අධ්‍යන ප්‍රවේශ අතිශයින් සමපේක්ෂණ හා ප්‍රතිමානීය වේ.
(4) අධ්‍යයන ප්‍රවේශයන් විදග්ධ වහරේදී සුසමාදර්ශ (paradigms) ලෙස හැඳින් වේ.
(5) දාර්ශනික ප්‍රවේශය වැඩි අවධානය විද්‍යාත්ම අරමුණු කෙරෙහි යොමු වේ. (.....)

3. නූතන ජාතික රාජ්‍යයක ප්‍රධාන අංග ඇතුළත් පිළිතුර වන්නේ,

(1) පුරවැසිභාවය, නිශ්චිත දේශ සීමාව, ආණ්ඩුව, ස්වාධිපත්‍යය
(2) ජනගහනය, ජාතික පදනම, ආණ්ඩුව, ස්වාධිපත්‍යය
(3) ජාතික පදනම, භෞමිකත්වය, ආණ්ඩුව, ස්වාධිපත්‍යය
(4) ජනගහනය, භූමිය, ආණ්ඩුව, ස්වාධිපත්‍යය
(5) ජාතික පදනම, නිශ්චිත දේශ සීමාව, ආණ්ඩුව, ස්වාධිපත්‍යය (.....)

4. අයිතිවාසිකම් පිළිබඳව සම්භාව්‍ය, මධ්‍යකාලීන සහ මුල් නූතන දේශපාලන දාර්ශනිකයෝ ඇතුළත් කාණ්ඩය වන්නේ,

(1) අයිසයා බර්ලින්, රොනල්ඩ් ඩ්වෝකින්, ජෝන් රෝල්ස්,චාල්ස් ටේලර්
(2) ප්ලේටෝ, ඇරිස්ටෝටල්, සාන්ත ඔගස්ටින්, මැකියාවෙල්ලි
(3) ද තොක්විල්, ජෝන් ලොක්, ඇඩම් ස්මිත්, මාක්ස්
(4) කාන්ට්, ජෝන් රෝල්ස්, යර්ගන්, හබර්මාස්
(5) කාන්ට්, ප්ලේටෝ, මහත්මා ගාන්ධි, මයිකල් වෝල්ට්සර් (.....)

5. දේශපාලන මතවාදයන්ට අදාළ ලක්ෂණයක් නොවන්නේ,

(1) එකිනෙකට විසංගත අදහස් මාලාවකින් සමන්විත වේ.
(2) දේශපාලන මතිමතාන්තර හා විශ්වාස ආදියෙන් සමන්විත වේ.
(3) දේශපාලන ක්‍රියාකාරිත්වයට මඟ පෙන්වයි.
(4) දේශපාලන දෘෂ්ටිවාද සහ දේශපාලන චින්තනය යනු එයට යෙදෙන පර්යාය පද වේ.
(5) මතවාදය විශාල ජන කොටසක් ආකර්ෂණය කර ගැනීමට සමත්ය. (.....)

6. රාජ්‍යය සම්බන්ධ ස්ත්‍රීවාදී න්‍යායට අදාළ වන්නේ,

(1) ස්ත්‍රීවාදයට පවතින්නේ ලිබරල්, මාක්ස්වාදී ගුරුකුල පමණි.
(2) ස්ත්‍රීවාදීන් රාජ්‍යය පිළිබඳ ව දරන අදහස වන්නේ එය ස්ත්‍රීන් සතු විය යුතු මෙවලමක් බවයි.
(3) රාජ්‍යය සම්බන්ධ විශේෂ ස්ත්‍රීවාදී න්‍යායක් නොමැත.
(4) ලිබරල් ස්ත්‍රීවාදීහු ස්ත්‍රී විමුක්තිය සඳහා රාජ්‍යයේ මැදිහත් වීම අනුමත නොකරති.
(5) රාජ්‍යය හා දේශපාලනය පිළිබඳ විශේෂ ප්‍රවේශයක් යෝජනා කිරීමට ස්ත්‍රීවාදය අසමත් වී තිබේ. (.....)

7. ස්වාධිපත්‍යට අදාළ නිවැරදි ප්‍රකාශය නොවන්නේ,

(1) අභ්‍යන්තර හා බාහිර වශයෙන් දෙයාකාර වන බව විග්‍රහ කර ඇත.
(2) රාජ්‍යයන් පමණක් භුක්ති විඳින උසස් ම හා උත්තරීතර බලය වේ.
(3) අධිකාරී බලය යෙදවීම සඳහා රාජ්‍යයට සුජාතභාවය සැපයෙන සාධකය වේ.
(4) රාජ්‍යය වෙත පවතින වෙනත් ආයතනයක් සතු ව නැති බලය මින් අදහස් වේ.
(5) අන් අයට අණ දෙන, සේම අන් අයගෙන් අණ ලබන බලයකි.

(.....)

8. සන්ධීය ආණ්ඩුක්‍රමයේ ලක්ෂණයක් නොවන්නේ,

(1) මධ්‍යම ආණ්ඩුව සහ ප්‍රාන්ත ආණ්ඩු බලතල රාශියක් හිමි කරගනී.
(2) බලතල ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මඟින් නශ්චිතව දක්වා ඇත.
(3) එකිනෙකට සාපේක්ෂ වශයෙන් පරායත්ත ආණ්ඩු මට්ටම් දෙකකින් සමන්විත වේ.
(4) මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය ද්විමාණ්ඩලිකවාදය මත පදනම් වේ.
(5) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන අර්ථ නිරූපණය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සිදු කිරීම.

(.....)

9. රාජ්‍ය අභ්‍යන්තර ගැටුම් වැලැක්වීම කෙරෙහි බලපාන ප්‍රධාන දේශපාලන සාධකයක් වන්නේ,
(1) අසමාන ව හා වෙනස්කම් කොට සලකන දේශපාලන ආයතන පැවතීම.
(2) සෑම ජන කොටසකටම අදාළ නොවන බහිෂ්කාරක මතවාද පැවතීම.
(3) වාර්ගික කණ්ඩායම් අතර ඇති තියුණු දේශපාලන තරගය සහ ප්‍රතිවිරෝධතා.
(4) අර්බුද අවස්ථාවල දී ගැටුම් තියුණු වන පරිදි ඒවා පාවිච්චි කරන ප්‍රභූ දේශපාලනය.
(5) ගැටුමට සම්බන්ධ පාර්ශ්ව අතර සන්නිවේදනය සහ අවබෝධය ප්‍රවර්ධනය කිරීම. (.....)

10. දේශපාලන පක්ෂ සම්බන්ධයෙන් අදාළ නොවන්නේ.

(1) දේශපාලන පක්ෂයකට ප්‍රතිපත්තිමය සහ මතවාදී අනන්‍යතාවක් පවතී.
(2) ඇමරිකාවේ දේශපාලන පක්ෂවල කාර්යභාරය තහවුරු වූයේ දාහත්වැනි සියවස ආරම්භයේ දී ය.
(3) දේශපාලන පක්ෂ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයේ, නැතිවම බැරි අංගයකි.
(4) දේශපාලන පක්ෂ දීර්ඝ ඉතිහාසයකට හිමිකම් නොකියයි.
(5) දේශපාලන බලය ලබාගැනීම මඟින් ආණ්ඩු බලය ක්‍රියාත්මක කිරීමට උත්සාහ කරයි. (.....)

11. මෙරට නුහුරු සමාජය වෙනස් කිරීමට අදාළ යුරෝපීයන් ගනු ලැබූ ක්‍රියා මාර්ගයක් වූයේ,

(1) සිවිල් සේවය ප්‍රතිසංවිධානය කිරීම.
(2) වෙළෙඳ භාණ්ඩ සඳහා තීරු බදු වැඩි කිරීම.
(3) ආවෘත වෙළෙඳපොළක් හඳුන්වා දීම.
(4) රාජ්‍ය වෙළෙඳ ඒකාධිකාරය පවත්වාගෙන යෑම.
(5) අනිවාර්ය රාජකාරී සේවය පවත්වාගෙන යෑම.

(.....)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

12. පුරවැසියන්ට ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම සහ වටිනාකම් අදාළ නොවන්නේ,

(1) අන්‍යයින්ගේ විශ්වාස සහ අදහස්වලට ගෞරව සම්පන්නව සවන් දීමටය.
(2) අන් අයගේ විශ්වාස සහ ආගම්වලට ගරු කිරීමටය.
(3) විචාරාත්මක හැකියාව පවත්වා ගැනීමටය.
(4) සාමූහිකව තීරණ ගැනීමටය.
(5) අන්‍ය ආගම් විවේචනය කිරීමටය. (.....)

13. ජාතික වාදයට අදාළ නොවන ප්‍රකාශය වන්නේ,
(1)ජාතික වාදය ප්‍රධාන ප්‍රවේශ තුනක් යටතේ හඳුනාගත හැකි ය.
(2) ස්වයං තීරණ අයිතිය ජාතිකවාදය හා සම්බන්ධ ප්‍රධාන සංකල්පයකි
(3)වාර්ගික ප්‍රජාවන් අතර ඇතිවන සාමූහික දේශපාලන විඥානය ''වාර්ගික ජාතිකවාදය''වේ.
(4) ජාතිකවාදය යනුවෙන් ක්‍රමානකූල ඒකාග්‍ර චින්තනයක් ඇත.
(5)ජාතිකවාදය දේශපාලනික වශයෙන් බලගතු වුවත්, එය දාර්ශනික වශයෙන් දිළිඳු ය. (.....)

14. ඇමරිකානු ප්‍රාන්ත රාජ්‍යවලට අදාළ ප්‍රකාශය වන්නේ,

(1) විදේශ රාජ්‍ය සමඟ ගිවිසුම් ඇති කර ගැනීම.
(2) ණය වර පත්‍ර නිකුත් කිරීම.
(3) පළාත් පාලන ආයතන ඇති කිරීම.
(4) ආනයන හා අපනයන මත බදු පැනවීම.
(5) විදේශ නෞකාවලින් බදු අය කර ගැනීම.

(.....)

15. මැතිවරණ ක්‍රමය මඟින් ආරක්ෂා කළ යුතු මූලික නිර්ණායකයක් වන්නේ,

(1) කලින් කලට මැතිවරණ පැවැත්වීමය.
(2) තරගය වළක්වන ආකාරයේ නීති පැනවීමය.
(3) ඡන්දදායකයන්ට ඡන්ද ප්‍රකාශ කිරීමට නිදහස තිබීමය.
(4) මැතිවරණ දූෂිත නොවන අන්දමට සිදු කිරීමය.
(5) වයස සැපිරූ සියලු පුරවැසියන්ට ඡන්ද ප්‍රකාශ කිරීමට අයිතිය ලබා දීමය. (.....)

16. සෝල්බරි ව්‍යවස්ථාවෙහි රාජ්‍ය සේවයේ ස්වාධිනත්වය උදෙසා වූ විධි විධානයක් වන්නේ,

(1) රාජ්‍ය සේවා කොමිසම පිහිටු වීම.
(2) රාජ්‍ය සේවයේ පාලනය අමාත්‍ය මණ්ඩලයට භාර වීම. .
(3) රාජ්‍ය සේවකයන්ගේ විනය පාලනය රාජ්‍ය සේවා විනය මණ්ඩලය සතු වීම..
(4) පාර්ලිමේන්තුවේ සාමාජිකයින් රාජ්‍ය සේවා කොමිසමට පත් කළ හැකි වීම.
(5) දෙපාර්තමේන්තුවල කටයතු අදාළ ඇමතිවරයාට මුළුමනින් ම භාර වීම.

(.....)

17. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන ලක්ෂණයක් වන්නේ,

(1) ස්වාධීන රාජ්‍ය සේවා සංකල්පය ස්ථාපිත කිරීම.
(2) රාජාධිකරණයට අභියාචනා කිරීම.
(3) වෙස්ට්මින්ස්ටර් රාජාණ්ඩු ක්‍රමය .
(4) ප්‍රථම වරට සමූහාණ්ඩු ක්‍රමයක් ඇති කිරීම.
(5) ව්‍යවස්ථාදායකය ද්වි මණ්ඩල වීම.

(.....)

18. ජාත්‍යන්තර දේශපාලනයේ රාජ්‍ය ක්‍රියාධරයෙක් වන්නේ.
(1) අල් බයෙදා සංවිධානය.
(2) බ්‍රෙට්න්වුඩ්ස් සංවිධාන ජාලය.
(3) ලෝක වනජීවී අරමුදල (World Wildlife Fund).
(4) ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය.
(5) මයික්‍රොසොෆ්ට් සමාගම.

(.....)

19. ඇමරිකානු ආණ්ඩුක්‍රමයේ සාමාන්‍ය ලක්ෂණ නොවන්නේ,

(1) බලතල බෙදීමේ සිද්ධාන්තය හා සංවරණ තුලන ක්‍රමය ක්‍රියාත්මක වේ.
(2) ව්‍යවස්ථාව ''මහජන පරමාධිපත්‍යය'' යන සිද්ධාන්තය මත පදනම් වී ඇත.
(3) ඇමෙරිකාවෙහි ක්‍රියාත්මක වන්නේ සමූහාණ්ඩුවකි.
(4) ඇමෙරිකානු ව්‍යවස්ථාව, සංශෝධනයට ඉතා පහසු, සරල ක්‍රියාවලියකි.
(5) අධිකරණය නීතිවල ව්‍යවස්ථානුකූල භාවය විමර්ශනය කිරීමේ බලය ලබාගෙන ඇත (.....)

20. රාජ්‍යයක ජාතික අභිලාෂ සම්බන්ධයෙන් අදාළ නොවන්නේ,

(1) ප්‍රචාරණය රාජ්‍යයන් සිය ජාතික අභිලාෂ තහවුරු කරගැනීම සඳහා යොදාගනී.
(2) ආක්‍රමණ ජාතික අභිලාෂ මුදුන් පමුණුවා ගන්නා මාධ්‍යයක් නොවේ.
(3) ආර්ථික උපාය මාර්ග ජාතික අභිලාෂ මුදුන් පමුණුවා ගන්නා මාධ්‍යයකි.
(4) රාජතාන්ත්‍රික සබඳතා හරහා ජාතික අභිලාෂ ඉටු කර ගනී.
(5) ජාතික අභිලාෂ, එක් එක් ජාතීන් සතු ජාතික බලයේ ප්‍රකාශනයක් විය හැකි ය. (.....)

- **අංක 21 සිට 25 තෙක් වූ ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශ කාණ්ඩය ඇතුළත් වරණය තෝරන්න.**

21. ප්‍රජාතන්ත්‍රවාදයෙහි **ප්‍රජාවට වග වීම** සම්බන්ධ ප්‍රකාශයට අදාළ පිලිතුරු කාණ්ඩය වන්නේ,

A මෙමගින් ජනතාවට උත්තර දිය යුතු බව අර්ථවත්වේ.
B මෙය පැහැර හැරිය නොහැකි ප්‍රජාතන්ත්‍රවාදී වගකීමකි.
C වගකීමේ අර්ථයෙන් ක්‍රියා කිරීම ජනතාව ආණ්ඩුවෙන් අපේක්ෂා කරයි.
D මහජන වග වීම ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ ප්‍රායෝගික මුහුණතයි.
E පාලකයින් තමන් කරන ක්‍රියාවක් හෝ නොකර සිටීමක් සම්බන්ධයෙන් ජනතාවට උත්තර දීම අත්‍යවශ්‍ය නොවේ. .

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (.....)

22. රාජ්‍ය ප්‍රතිපත්ති,

A රාජ්‍ය ප්‍රතිපත්තියක් යනු ක්‍රියාදාමයකි.
B රාජ්‍ය ප්‍රතිපත්තිය නිර්මාණය කිරීම දේශපාලඥයින්ගේ කාර්යකි.
C ශාස්ත්‍රීය ව හැදෑරීම ආරම්භ වූයේ ඇමෙරිකානු සන්දර්භයෙහි ය.
D ප්‍රතිපත්ති ක්‍රියාදාමයේ පස්වන අදියර ප්‍රතිපත්ති ඇඟයීමයි.
E ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම තාක්ෂණික ශිල්පීය ක්‍රියාවලියකි.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (.....)

23. ප්‍රංශ පළාත් පාලනය ආයතන සම්බන්ධව අදාළ ප්‍රකාශ කාණ්ඩය වන්නේ,

A ප්‍රංශය කලාප 22කින් සහ දෙපාර්තමේන්තු 96 කින් යුක්ත ය
B පළාත් පාලනය ආයතන මට්ටම් 3ක් යටතේ සංවිධානය කර තිබේ.
C පොදු තීන්දු ගැනීම මට්ටම් තුනම යටතේ සිදු නොකෙරේ.
D කොමියුනයේ මහජන නියෝජන සභාව වන්නේ නගර සභාව යි.
E කලාප කවුන්සිලයේ වගකීම වන්නේ කලාප අයවැය සම්මත කිරීම ය.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (.....)

24. 1978 ව්‍යවස්ථාවේ ඔම්බුඩ්ස්මන් ධූරයට **අදාළ** ප්‍රකාශ කාණ්ඩය වන්නේ,

A ඔම්බුඩ්ස්මන්වරයා පෙත්සම් සම්බන්ධව නිර්දේශ සිය වාර්තාව මඟින් ඉදිරිපත් කරයි.
B මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් ආශ්‍රිත පැමිණිලි විභාග කිරීම මූලික කාර්යයි.
C තමන්ගේ තීරණය අදාළ ආයතනයේ ප්‍රධානියාට වාර්තා කළ යුතුය.
D 1978 ආණ්ඩු ක්‍රමයට එක් කරන ලද නවාංගයකි.
E අග්‍රවිනිශ්චකාරවරයා විසින් ඔම්බුඩ්ස්මන්වරයා පත් කරනු ලබයි

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (.....)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

25. නිලබල ක්‍රමය පිළිබඳ න්‍යායට අයත් වන්නේ,

A නිලබලකාරී සංවිධානයක පෞද්ගලික සම්බන්ධතා පවතී.
B නිලබලකාරී සංවිධානයේ සේවකයෝ වැටුප් ලබන්නෝ වෙති.
C නිලබලකාරී සංවිධානයේ කෘත්‍යයන් විභජනය කර තිබේ.
D නිලබල ක්‍රමය යනු රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා භාවිතයට ගැනෙන නිලධාරී පන්තිය යි.
E නිලබල ක්‍රමය පිළිබඳ සම්භාව්‍ය න්‍යාය ඉදිරිපත් කළේ මැක්ස් වෙබර් ය.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (.....)

අංක 26 සිට 30 දක්වා ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. ඒ එක් එක් ප්‍රශ්න අංකයට අදාළව දී ඇති යෙලුම් යුගල සම්බන්ධයෙන් පහත I වගුව සඳහා යොමුවෙහි සඳහන් 1,2,3,4 සහ 5 යන වරණවළින් සුදුසු වරණය තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

වගුව සඳහා යොමුව

අංකය	ප්‍රකාශය I	ප්‍රකාශය II
1	සත්‍ය	සත්‍ය
2	සත්‍ය	අසත්‍ය
3	අසත්‍ය	සත්‍ය
4	අසත්‍ය	අසත්‍ය
5	සත්‍ය	සත්‍ය වන අතර පළමු ප්‍රකාශය තවදුරටත් තහවුරු කරයි.

I. වගුව

ප්‍රකාශය I	ප්‍රකාශය II	
26. සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුවට පරම ව්‍යවස්ථාදායක බලයක් හිමි නොවී ය.	1947 ලංකා ස්වාධීනතා පනත අනුව ලංකාවේ ඉල්ලීම හා කැමැත්ත මත ලංකාව වෙනුවෙන් නීති පැනවීමේ බලය බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව සතු විය.	(....)
27. ශ්‍රී ලංකාවේ පළාත් සභා, මධ්‍යම ආණ්ඩුව හා පළාත් පාලන ආයතන අතර පිහිටි නව ආණ්ඩු බල ආයතනයකි.	පළාත් සභා ක්‍රමය අයත් වන්නේ දේශපාලන බලය මධ්‍යගත කිරීම යන ප්‍රභේදයට ය.	(.....)
28. 1972 ව්‍යවස්ථාවේ 44 වන වගන්තියට අනුව ජාතික රාජ්‍ය සභාවේ ව්‍යවස්ථාදායක බලතල උත්තරීතර විය.	ජාතික රාජ්‍ය සභාවේ ව්‍යවස්ථාදායක බලයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිච්ඡින්න කිරීමේ හා සංශෝධනය කිරීමේ බලය හා නව ව්‍යවස්ථාවක් පැනවීමේ බලය ද ඇතුළත් විය.	(.....)
29. 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතින් ශ්‍රී ලංකාවේ කලාප 25 කට බෙදා එක් එක් කලාපය තුළ මහාධිකරණයක් බැගින් පිහිටුවන ලදි.	1972 ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවන්ගේ විශ්‍රාම යා යුතු වයස 63 ලෙස නිශ්චය කරන ලදී.	(.....)
30. 18 වන සංශෝධනයෙන් රාජ්‍ය සේවා කොමිසම, මැතිවරණ කොමිසම සහ ජාතික පොලිස් කොමිසම ආදි කොමිසන් සභාවල බලතල විශාල ලෙස වැඩි කරන ලදි.	19 වන සංශෝධනය මඟින් ශ්‍රී ලංකාවේ ආණ්ඩු ආයතන පද්ධතියට පාර්ලිමේන්තු සභාව නම් වූ ආයතනය හඳුන්වා දෙන ලදී.	(.....)

B - කොටස

- **ප්‍රශ්න අංක 31 සිට 50 දක්වා ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

31. ග්‍රීක නාගරික රාජ්‍යයට අනන්‍ය වූ අදහස් දෙක දක්වන්න.
(i) .....
(ii) .....

32. පහත කෘතිවල කතුවරු පිළිවෙලින් ලියා දක්වන්න.
i. පරිකල්පිත ප්‍රජාව (*Imagined Communities*).....
ii. **යුක්තිය පිළිබඳ න්‍යායයක්** (*A Theory of Justice*)- .....

33. තුන්වැනි ලෝකයේ සමාජවාදී මතවාදයෙහි ප්‍රධාන ප්‍රකාශකයෝ දෙදෙනෙක් නම් කරන්න.
i. - .....
ii. - .....

34. ආණ්ඩුවට ඇත්තේ **සීමිත** බලයකි. එම බලය සීමා වන මාධ්‍ය දෙක දක්වන්න.
(i) .....
(ii) .....

35. ඒකීය රාජ්‍යයන්හි මධ්‍යයේ සිට පහළ මට්ටම්වලට පරිපාලන බලය විසුරුවා හැරීම ප්‍රධාන ආකාර දෙකක් දක්වන්න.
(i) .....
(ii) .....

36. "ප්‍රතිසන්ධානගත වීම මට්ටම් තුනකින් සිදුවීම අවශ්‍ය වේ" ඉන් දෙකක් දක්වන්න.
(i) .....
(ii) .....

37. යටත් විජිත ආර්ථික හා සමාජ පරිවර්තනය මට්ටම් දෙකක් යටතේ සිදු විය. ඒවා දක්වන්න.

(i) .....
(ii) .....

38. බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම ආයතනවල ක්‍රියාකාරිත්වය හසුරුවන රීති හා සම්ප්‍රදායයන් දෙකක් දක්වන්න.
(i).....
(ii) .....

39. ඇමරිකානු ප්‍රාන්ත රාජ්‍ය සම්බන්ධයෙන් මධ්‍යම රජයට පැවරී ඇති බලය කරුණු හතරක් මත රඳා පවතී. ඒවායින් දෙකක් දක්වන්න.
(I).....
(ii) .....

40. ජාතිකවාදය ප්‍රධාන ප්‍රවේශ තුනක් යටතේ හඳුනාගත හැකි ය. ඉන් දෙකක් දක්වන්න.
(i) .....
(ii) .....

41. "ආණ්ඩුවේ වග වීම පිළිබඳව අදහසට මාන **දෙකක්** පවතී". ඒවා දක්වන්න
(i) .....
(ii) .....

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

42. ශ්‍රී ලංකාවේ ''නව වම'' නියෝජනය කළ පක්ෂ දෙකක් දක්වන්න.
(i) .....
(ii) .....

43. පහත නිර්ණායකයන්ට අදාළ ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණයන් දක්වන්න.

(i) පළාත් සභා පිහිටු වීම අරභයා ව්‍යවස්ථාපිත හා නෛතික ප්‍රතිපාදන සැපයීම.

.....

(ii) අගමැතිවරයා විධායක බලතලවලින් ශක්තිමත් කිරීම හා රාජ්‍ය සභාවක් (Council of State) ස්ථාපිත කිරීම.
.....

44. පහත නිර්ණායකයන්ට අදාළ ආණ්ඩු මාදිළි දක්වන්න.
(i) රාජ්‍යයේ/ ආණ්ඩුවේ මැදිහත් වීම්වලින් සහ ඒවායේ පාලනවලින් ලබන නිදහස සහිත ආණ්ඩු ක්‍රමය
.....
(ii) රාජ්‍යයට, ජාතියට සහ නායකයාට කොන්දේසි විරහිතව අවනත වීමේ පරිමාව මත නිදහස තීරණය වන ආණ්ඩු ක්‍රමය.....

45. 20 සියවසේ සමූහාණ්ඩුවාදී සම්ප්‍රදායයේ ප්‍රධාන චින්තකයන් මතු කළ අදහස්වල ප්‍රධාන තේමා **දෙක** දක්වන්න.

(i) .....
(ii) .....

46.(i) ප්‍රංශ කොමියුනයේ මහජන නියෝජන සභාව හඳුන්වන නාමය කුමක්ද?.....
(ii) එහි විධායක නිලධාරීයා හඳුන්වන නාමය කුමක්ද?.....

47. රාජ්‍ය ප්‍රතිපත්තිය හැඳෑරීම් **දෙ ආකාර** ස්වභාවයක් ගනී. ඒවා නම්කරන්න.

(i) .....
(ii) .....

48. අධිකරණයේ ස්වාධීනත්වය යන්න පාර්ශව තුනක සහභාගීත්වයෙන් ආරක්ෂා කළ යුතු මූලධර්මයකි. එම පාර්ශ්ව තුනෙන් **දෙකක්** නම්කරන්න.

(i) .....
(ii) .....

49. නූතන රාජ්‍ය විදේශ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්නා වූ ක්‍රමවේද **දෙකක්** නම්කරන්න.
(i) .....
(ii) .....

50. ශ්‍රී ලංකාව සබඳතා පවත්වන ප්‍රධාන ජාත්‍යන්තර මූල්‍ය ආයතන **දෙකක්** නම්කරන්න.
(i) .....
(ii) .....


❄❄❄

LOL
Book Store

වාරෙටම ඕන කරන පොත් එකපාර
ඕඩර් කරලා දැන් ගෙදරටම ගෙන්වා ගන්න

25% OFF
ALL BOOKS

**Including Exercise Books,
CR Books, and B5 Books**



ඕනෙම අභ්‍යාස පොතකට 25%ක විශේෂ වට්ටමක්

ORDER BOOKS FROM LOL BOOKS STORE

0372060110 **WWW.LOL.LK**

071 777 4440 (WhatsApp)

Cash On Delivery Available

ORDER GCE A/L SHORT NOTES, MODEL, REVISION BOOKS & PAST PAPERS IN SINHALA, ENGLISH & TAMIL MEDIUM





LOL BOOK STORE

CASH ON DELIVERY AND KOKO PAYMENT AVAILABLE

WHATSAPP - 0717774440

WEBSITE: WWW.LOL.LK

GET READY FOR YOUR A/Ls WITH LOL BOOK STORE!